# ශ්‍රී ලංකාවේ මුල් මානව සමාජයේ සන්නිවේදනයේ ආරම්භය හා විකාශනය

ආචාර්ය සේන නානායක්කාර[1], තිස්ස වීරසේකර[1], ආචාර්ය තුසිත මැන්දිස්[2]
[1]ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය, මිහින්තලේ , [2]මධ්‍යම සංස්කෘතික අරමුදල

ශ්‍රී ලංකාවේ මෙතෙක් සිදුකොට ඇති පුරාවිද්‍යා හා මානව විද්‍යා අධ්‍යයනයන්ට අනුව මුල් ජන සම්භවය සිදුවන්නේ අදින් වසර 125000 - 74000 අතර කාලයේ දී බව ශිරාන් දැරණියගල බූන්දල හා පතිරාජවෙල ආශ්‍රිතව සිදුකරනු ලැබූ පර්යේෂණ මගින් පෙන්වා දී ඇත ( Deraniyagala : 1992). ශ්‍රී ලංකාවේ මානව සම්භවය පිළිබඳ තතු එසේ හෙයින් ඒ සමගම මානවයා අතීතයේදී සිතුවම් හා භාෂාව හෝ ශබ්ද ඔස්සේ තම සන්නිවේදනය සිදුකරන්නට ඇති බව මෙම ප්‍රාථමික ජන සමාජ ආශ්‍රිතව සිදුකොට ඇති මානව විද්‍යා අධ්‍යයන මගින් උපකල්පනය කල හැකි ය.

අදින් අවුරුදු 125000 කට පූර්වයෙහි අග්නි පැලියොලිතික (Palaeolithic) සංස්කෘතියේ මානවයින්ගේ සන්නිවේදන සබඳතා හඳුනාගැනීමට පුරාවිද්‍යා සාධක නොමැති වුවත් ඊට පසුව ආරම්භ වන මධ්‍යශිලා (Mesolithic) යුග තුළින් හා පූර්ව හා ඓතිහාසික අවධි තුළින් මේ පිළිබඳ සාක්ෂි හඳුනාගත හැකි වේ.

මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ පුරාවිද්‍යා දත්ත උපයෝගි කර ගනිමින් ශ්‍රී ලංකාවේ මුල් මානව සමාජයේ සන්නිවේදනයේ ආරම්භය හා විකාශනය පිළිබඳ විමර්ශනයක් සිදුකිරිම ය.

ප්‍රධාන වශයෙන් පුරාවිද්‍යා දත්ත තුළින් කරුණු තහවුරු කර ගැනීම මෙහි පර්යේෂණ ක්‍රමවේදය විය. ශ්‍රී ලංකාවී මධ්‍යශිලා අවධිය අදින් අවුරුදු 40000 පූර්වයෙහි සිට අදින් අවුරුදු 2000 කාලයක් තුළ ශ්‍රී ලංකාවේ ස්වභාවික පරිසරය තුළ ක්‍රියාත්මක වී ඇත. දඩයම හා එල වැල නෙලීම යන සරල ආර්ථිකය ක්‍රියාත්මක කල මෙම මිනිසා ශ්‍රී ලංකාවේ පහත මහවැලි නිම්නයේ හැර අනෙකුත් ස්වභාවික පරිසරය තුළ ක්‍රියාත්මක වී ඇත. හෝමෝ සේපියන්ස් සේපියන්ස් බලංගොඩන්සිස් වශයෙන් මානව විද්‍යාඥයින් හඳුන්වා ඇති මෙම මිනිසා නූතන මානවයා වශයෙන් ද හඳුන්වනු ලැබේ ( Deraniyagala : 1998).

ශ්‍රී ලංකාවේ මානව ඉතිහාසය තුළ විධිමත් සන්නිවේදනය භාෂාව වශයෙන් මොහු කිනම් ආකාරයකට හැසුරුවේදැයි පිළිබඳව සාක්ෂි සොයාගත නොහැකි උවද මෙසොලිතික මානවයා හෙවත් බලංගොඩ මානවයා විසින් අඳින ලදැයි විශ්වාස කල හැකි ඔහු තම නිවස්න කරගත් ගල්ගුහා තුළින් අනාවරණය කරගෙන ඇත. බෙල්, සෙලිග්මාන් යුවල, ජෝන් ස්ටිල්, ෆෙඩ්රික් ලූවින්, බ්‍රවුනින්, දැරණියගල, සද්ධාමංගල කරුණාරත්න, ආදිත්‍ය, කරුණාරත්න, නන්දදේව, සේනක බණ්ඩාරනායක, රාජ් සෝමදේව ආදී විද්වතුන්ගේ අධ්‍යයනයට 1897 සිට 2012 දක්වාම පාත්‍රවී තිබේ.

ඔවුන් පෙන්වා දුන් ආකාරයට උතුරුමැද පළාතේ බිල්ලෑව හා කෝමාරිකා ගල්ගෙය, කෑගල්ල දිස්ත්‍රික්කයේ දොරවක කන්ද, නැගෙනහිර පළාතේ මන්ඩා ගල්ගේ ආදී විවිධ පළාත්වල නොයෙක් ස්ථානවලින් පමණක් නොව තවත් විශාල ගල් ලෙන් රාශියකින් මෙම මානවයා විසින් යම් යම් අදහස් පළකිරීමට අඳින ලද සත්ත්ව රූප හා විවිධ සංකේත රාශියක් හඳුනාගෙන ඇත.

සමහර විද්වතුන් මෙම ගුහා සිතුවම් වැදි සිතුවම් ලෙස අර්ථ දක්වන අතර සමහර අය මේවා ප්‍රාථමික ගුහා සිතුවම් ලෙසත් තවත් සමහර විද්වතුන් ප්‍රාග් ඓතිහාසික සිතුවම් ලෙසත් අර්ථ දක්වා තිබුණද මෙම සිතුවම් සිතුවම් කොට ඇත්තේ මධ්‍යශිලා යුගයේ මානවයා වාසස්ථාන පිහිටුවාගෙන සිටි ස්ථානවල බැවින් මේවා බොහෝ විට ප්‍රාථමික ජනයා තම සිතුම් පැතුම් කුරුටු සංකේත හා චිත්‍ර මාර්ගයෙන් ඉදිරිපත් කිරීමට ගනු ලැබූ උත්සාහයක් ලෙස සැලකිය හැකි ය. ඒ අනුව ශ්‍රී ලංකාවේ මුල්ම සන්නිවේදනය සිතුවම් හා සංකේත අනුසාරයෙන් ප්‍රාග් ඓතිහාසික මානවයා විසින් එළිදක්වා තිබෙන බව පෙන්වා දිය හැකි යි

ප්‍රාථමික දඩයම් ජීවිතයක් ගත කල ජන සමාජය තුළට ක්‍රිස්තු පූර්ව 1359 පමණ වනවිට යකඩ භාවිතා කල එඬේර කටයුතු මෙහෙයවන ලද ප්‍රාථමික කෘෂි කර්මාන්තය තම ජීවනෝපාය කරගත් ජන සමාජයක ප්‍රවිශ්ටවීම හඳුනාගත හැකි ය. මොවුන් ශිලා මෙවලම් තාක්ෂණය නොව ලෝහ තාක්ෂණය හැසිරූ පිරිසක් බැවින් ස්වභාවික පරිසරයෙන් මිදී ග්‍රාමීය ජනාවාස පිහිටුවීමට උත්සාහ ගත් ජනතාවක් විය. ශ්‍රී ලංකාවේ උතුරු උතුරු මැද අග්නිදිග, නැගෙනහිර, වයඹ හා දකුණු දිග ප්‍රදේශවල වාසභූමි ඇති කරගත් මේ ප්‍රජාව නිශ්චිත වශයෙන්ම සන්නිවේදන මාධ්‍යයන් ආරම්භකර තිබූ බවට සාධක අනුරාධපුර ඇතුළුපුර, කන්තරෝදය, තිස්සමහාරාමය, ඉබ්බන්කටුව, යාපහුව පින්වැව ආදී පූර්ව ඓතිහාසික ජනාවාස හා සුසාන ස්ථාන ආශ්‍රිත කැණීම්වලදී හඳුනාගෙන තිබේ.

මොවුන් ප්‍රධාන ලෙසම ලේඛනය සන්නිවේදනය වශයෙන් ආරම්භ කල බවට හඳුනාගත හැක්කේ මෙම යුගයේ කාලරක්ත වර්ණ මැටි මෙවලම් හා රක්ත වර්ණ මැටි මෙවලම් මත පිළිස්සීමෙන් පසු විවිධ කුරුටු සළකුණු දමා තිබීම නිසාය. විශේෂයෙන්ම ක්‍රිස්තු පූර්ව 1000 - 600 කාලයේ දී බ්‍රාහ්මී නොවන මෙම කුරුටු සංකේත ලේඛනගත කිරීමේ ක්‍රමය අක්ෂර දක්වා පරිවර්තනය වූ බවට සාධක අනුරාධපුර ඇතුළුපුරයෙන් හඳුනාගෙන ඇත. එහිදී ක්‍රිස්තු පූර්ව 600 - 500 කාලයට කාලය නියම වී ඇති පස් ස්තර තුළින් බිය අනුරද හා තයාකුටෙ යන නාම සඳහන් බ්‍රාහ්මී ලේඛන ලැබීම තුළින් ලංකා සමාජය එම කාලය වනවිට සන්නිවේදනය සඳහා ඉදිරි පියවරක් භාෂා මාධ්‍ය ඔස්සේ තබා ඇති බව පැහැදිලි වේ. පසුව මෙම අක්ෂර සංවර්ධනය වීම මුල් ඓතිහාසික අවධිය තුළින් හඳුනාගත හැකි ය.

ක්‍රිස්තු පූර්ව 300 - ක්‍රිස්තු වර්ෂ 100 ශ්‍රී ලංකාවේ මුල් ඓතිහාසික අවධියට අයත් කාල පරාසය ලෙස පිළිගනු ලබයි ( Senevirathne : 1996). මෙම කාල පරිච්ඡේදය තුළදී නිශ්චිත ලෙස ලේඛන සන්නිවේදනය මුල් බැස ගන්නා අතර ඒ පිළිබඳ පුරාවිද්‍යා සාධක කටාරම් ගැටි සහිත ගුහා තුළින් හඳුනාගත හැකි ය. විශේෂයෙන්ම මුල් ඓතිහාසික අවධියේ සමාජ සැකැස්ම තුළ දැකගත හැකි පරුමක, රජ, ගහපති, ගමික, බරත, බත, අය වැනි ජන කණ්ඩායම් මේ කාලයේ දී ලේඛන සන්නිවේදනය දියුණු කිරීමට උත්සාහ ගත් බව එම අභිලේඛන තුළින් පැහැදිලි වේ.

තවද මෙහි වැදගත්ම කාරණය වන්නේ මෙම ශිලා ලිපි පසෙකින් කොටා ඇති අක්ෂර නොවන සංකේතයි. ඒවා බොහෝ විට පූර්ව ඓතිහාසික අවධියේ සුසාන වල පියන්ගල් මත හා මැටි බඳුන්වල දක්නට ලැබෙන සංකේත බැවින් එයින් ඔවුන් ගම්‍ය කිරීමට උත්සාහ ගනු ලැබුවේ තමාගේ මුල් සම්භාව්‍ය ඊට පෙර ජන කණ්ඩායමෙන් සිදුවූ බව හැඟවීමට පුළුවන. කෙසේ වෙතත් ක්‍රිස්තු පූර්ව 300 න් පසු මුල් බැස ගන්නා බ්‍රාහ්මී ලේඛන කලාව ශ්‍රී ලංකාවේ සිංහල භාෂාවේ වර්ධනයට ක්‍රමානුකූලව පත්වන ආකාරය අභිලේඛනඥයින් විසින් පෙන්වා දී ඇත.

සමාප්තියක් ලෙස මෙම කරුණු කාරනා අධ්‍යයනය කිරීමෙන් ශ්‍රී ලංකාවේ සන්නිවේදනය භාෂාව වශයෙන්, ලේඛනය වශයෙන් හා අදහස් ප්‍රකාශ කිරීමේ මාධ්‍ය ලෙසට ඉතා ප්‍රාථමික මට්ටමින් ආරම්භව වර්ධනය වී විකාශනය වූ අන්දම මුල් ජන කණ්ඩායම් වන ප්‍රාග් ඓතිහාසික, පූර්ව ඓතිහාසික හා මුල් ඓතිහාසික ජන පිරිස් සිදුකර ඇති සන්නිවේදනය තුළින් පැහැදිලි වේ.

යතුරු පද : කුරුටු සංකේත, ප්‍රාථමික සිතුවම්, අක්ෂර නොවන සංකේත, පූර්ව හා මුල් ඓතිහාසික අවධිය

ආශ්‍රිත ග්‍රන්ථ :

1.Deraniyagala. S.U 1992 *The Prehistory of Sri Lanka.* P I & II, Department of Archaeology. Colombo.

1.Senavirathna .S 1984 *The Archaeology of Megalithic Black and Red Were Complex in Sri Lanka,* Ancient Ceylon No 5. 237 299. Department of Archaeology. Colombo.